**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**
**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා (අරක්කැමි, ජල යන්ත්‍ර ක්‍රියාකරු සහ සංචාරක බංගලා භාරකරු) බඳවා ගැනීම (විවෘත) 2017**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරු වල පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට පහත සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් 2018.07.20 දිනට අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** වැටුප් ක්‍රමය.

i. වැටුප් පරිමාණය:-
PL-2-2016 රා.ප.ච.ලේඛ 03/2016 අනුව
රු.25250-10x270-11x300-10x330-12×350-38450.

**02. සේවයේ අනුයුක්ත කරවීමේ පොදු නියමයන් හා සේවා කොන්දේසි.**

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
ii. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
iii. මෙම තනතුරු දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සම්පාදනයට සහාය දීම යනාදී රාජකාරී ඉටු කිරීම පිණිස වන අතර තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය.

**03. වයස් සීමාව:-**

තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට (එනම් 2018.07.20 දිනට) වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**04. සුදුසුකම්**

**I.** අධ්‍යාපන සුදුසුකම්:

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබිය යුතුය.

**II.** වෘත්තීය සුදුසුකම්:

සෑම අයදුම්කරුවෙකුම අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලැබ ඇති ජාතික වෘත්තීය කුසලතාවන්හි දෙවන මට්ටම (NVQ02) නිපුනතාවයක් ලබා තිබිය යුතුයි.

**III.** පළපුරුද්ද :

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) පළපුරුද්දත් පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය. එම පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතුය.

**IV.** කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

**V. වෙනත් සුදුසුකම් :**

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් 2018.07.20 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**05. බඳවා ගැනීමේ ක්‍රමය :**

i. වන සංරක්ෂක ජනරාලි විසින් පත් කරනු ලබන වෘත්තීය පරීක්ශන මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් අතරින් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඒ අනුව වෘත්තීය පරීක්ෂණයට හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට ලබා ගන්නා ලකුණු ඒකතුවේ කුසලතාවය මත පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

ii. අපේක්ෂකයින් පෙනී සිටිය යුතු වෘත්තීය පරීක්ෂණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පහත පරිදි ලකුණු ලබාගත යුතුයි.

(අ) වෘත්තීය පරීක්ෂණය :

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම | 40 | 40 % |
| 2. විශේෂිත විෂය ක්ෂේත්‍රයන් හා අදාළ උපකරණ නඩත්තුව හා අළුත්වැඩියාව පිළිබඳ දැනුම | 60 | |

(ආ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 | අදාළ නොවේ |
| 2. අතිරේක පළපුරුද්ද | 40 | |
| 3. තනතුරට හිමි ක්ෂේත්‍රයට අදාළව රජය පිළිගත් ආයතනයක හදාරා ඇති පාඨමාලා හා ලබා ඇති පුහුණුව | 25 | |
| 4. සම්මුඛ පරීක්ෂනයේදී දක්වනු ලබන කුසලතාවය | 05 | |

**06. අයදුම්පත් හා අනෙකුත් විස්තර:**

i. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව, අයදුම් පත්‍රයේ අංක 01 සිට 08 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවටද, ඉතිරිය ඊළඟ පිටුවලටද ඇතුලත් වන පරිදි සෙ. මී. 21x29 (A4 ප්‍රමාණයේ) කඩදාසි වල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් ඉල්ලුම්පත සකස් කළ යුතු අතර, අයදුම්පත්‍රය තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත්‍රය සමඟ සුදුසුකම් සනාථ කෙරෙන ලියවිලි හෝ සහතික පත් ආදියෙහි ඡායාපිටපතක් අමුණා ඒවිය යුතුයි. ඉල්ලුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ, *අයදුම් කරන තනතුර සඳහන්* කර 2018.07.20 දින හෝ ඊට පෙර ලැබෙන සේ "*වන සංරක්ෂක ජනරාල්, ආයතන අංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,* සම්පත්පාය, *රජමල්වත්ත පාර, බත්තරමුල්ල*" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (පෞද්ගලික නමකට හෝ වෙනත් කිසිදු ලිපිනයකට හෝ නොඑවිය යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

ii. අසම්පූර්ණ හෝ ප්‍රමාදවී හෝ ලැබෙන ඉල්ලුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iii. තැපෑලේදී අස්ථාන ගතවන ඉල්ලුම්පත් පිළිබඳව වග කියනු නොලැබේ.

iv. ඉල්ලුම්පත ලද බව දන්වනු නොලැබේ.

**07. පරීක්ෂණ ගාස්තු :**

i. පරීක්ෂණ ගාස්තුව රු. 600.00 කි. එම ගාස්තුව භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-99 යටතේ රාජ්‍ය ආදායමට බැර වන පරිදි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඕනෑම දිසා වන කාර්යාලයකට, කලාප කාර්යාලයකට, ප්‍රධාන කාර්යාලයට හෝ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත ඉහත මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සිය / ලදුපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. පරීක්ෂණ ගාස්තුව අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනය වන 2018.07.20 දිනට පෙර ගෙවිය යුතුය. (එම කුවිතාන්සියේ / ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරු ළග තබා ගැනීම සුදුසුය.)

**08.** තෝරා ගැනීමට පෙර හෝ පසු හෝ අපේක්ෂකයෙකු අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නැති බව අනාවරණය වුවහොත්, ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය හෝ තෝරා ගැනීම අවලංගු කළ හැකි අතර, අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ ඔහුව තෝරා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් ඔහු රාජ්‍ය සේවයෙන් පහ කිරීමට යටත් වනු ඇත.

**09.** අවශ්‍ය අවස්ථාවකදී, මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව වන සංරක්ෂක ජනරාල් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

**10.** සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළ වන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් ඇති බව පෙනී යන්නේ නම් ඒවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කළ යුතු වේ.

**දිනය: 2018.07.**

වන සංරක්ෂක ජනරාල්

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

## ආදර්ශ අයදුම්පත්‍රය

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අරක්කැමි, ජල යන්ත්‍ර ක්‍රියාකරු සහ සංචාරක බංගලා භාරකරු යන කණිෂ්ඨ සේවා තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම 2018**

| |
|---|
| **අයදුම් කරන තනතුර - ........................................................** |

01. i. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

.......................................................................................................................

(උදා - GUNAWARDHANA, M.G.B.S.K.)

ii. සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

.......................................................................................................................

iii. සම්පූර්ණ නම : (සිංහලෙන් / දෙමළෙන්)

.......................................................................................................................

02. ස්ථිර ලිපිනය : (සිංහලෙන් / දෙමළෙන්)

.......................................................................................................................

03. ස්ත්‍රී / පුරුෂ භාවය : ☐

පුරුෂ - 0

ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

05. උපන් දිනය : අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

06. 2018............ දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

07. දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

08. අධ්‍යාපන සුදුසුකම් :

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය.
(ප්‍රතිඵල සටහනෙහි සහතික කළ පිටපතක් අමුණන්න)

I වන වර

වර්ෂය : ............................

විභාග අංකය : ............................

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |

II වන වර

වර්ෂය : ............................

විභාග අංකය : ............................

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |

09. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :

........................................................................................................................

........................................................................................................................

(සහතික කළ පිටපත් අමුණන්න)

10. වෘත්තීය / වෙනත් සුදුසුකම් :

........................................................................................................................

........................................................................................................................

(සහතික කළ පිටපත් අමුණන්න)

11. පළපුරුද්ද :

........................................................................................................................

........................................................................................................................

(සහතික කළ පිටපත් අමුණන්න)

12. i. පරීක්ෂණ ගාස්තු ගෙවූ කලාප කාර්යාලය / ප්‍රධාන කාර්යාලය සඳහන් කරන්න.

.........................................................................

ii. ලදුපත් අංකය හා දිනය :

.................................. / ..................................

| ලදුපත නොගැලවෙන පරිදි මෙහි අලවන්න |
|---|

13. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පතේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය බවට ද, නිවැරදි බවටද මම සහතික කරමි. මෙහි ඇතුළත් වූ තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව හෝ මා තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අයදුම්පත අවලංගු වීමට යටත් බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

දිනය.................                                   ඉල්ලුම්කරුගේ අත්සන .....................